# තිහගොඩ ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු මස 04 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 දෙසැම්බර් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ඔක්තෝබර් 08 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් වෙතින් සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමේදී සභිකයින්ට ලබාදී ඇති යතුරු පැදි සඳහා ණයවාරික ලෙස අයකර ගන්නා ලද රු.337,480 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ආධාර ගිණුම බැර කර වැටුප් හා දීමනා වියදමට හර කර නොතිබුණි.

(ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් වෙතින් 2014 දෙසැම්බර් මාසය සඳහා කාර්ය මණ්ඩල වැටුප් හා සභික දීමනා සඳහා පිළිවෙලින් රු.1,128,500 ක් හා රු.116,270 ක් වශයෙන් ලබාදෙන ලද රු.1,244,770 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ආධාර අය ශීර්ෂයට බැර කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂය සඳහා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළයුතු රු.39,412 ක මුදල සමුච්චිත අරමුදල හර කර ගෙවිය යුතු විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළයුතුව තිබුණද එකී වටිනාකම නොගෙවූ වැටුප් හා වේතන ගිණුමට බැර කර තිබුණි.

(ඈ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් වෙතින් 2014 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර්, දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු රු.32,307 ක් වූ දේපල ණය පොලී මුදල් ලැබිය යුතු විවිධ අත්තිකාරම් (දේපල ණය පොලී) ගිණුමට බැර කර නොතිබුණි.

(ඉ) 2014 සැප්තැම්බර් මස පොදු ගිණුමෙන් කර්මාන්ත ගිණුමට රු.600,000 ක් මාරු කර තිබූ අතර, එකී මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර අය ශීර්ෂයට බැර කර තිබුණි.

(ඊ) මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු.4,369,291 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර අය ශීර්ෂයට බැර කර තිබුණි.

(උ) 2011 වර්ෂයට අදාල විගණන ගාස්තු රු.46,704 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා වැය ශීර්ෂයට හර කර තිබුණි.

(ඖ) 2014 දෙසැම්බර් 31 දිනට 609 දරන විවිධ සැපයුම් වැය ශීර්ෂයට අදාලව රු.256,762 ක මුදලක් බැර කළයුතුව තිබුණද එකී ගිණුමට බැර කරන ලද මුදල රු.236,762 කි. ඒ අනුව විවිධ සැපයුම් ණයහිමියන් රු.20,000 ක් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී රු.1,008,666 ක මුදලක් ප්‍රාග්ධන වියදම් (309) වැය ශීර්ෂයට හර කළ යුතුව තිබුණද එකී මුදල 109 වැය ශීර්ෂයට හර කර තිබුණි.

(ඒ) 2014 නොවැම්බර් හා දෙසැම්බර් මස ගෙවන ලද වාහන කුලී රු.47,500 ක මුදලක් ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂ 109 ට හර කර තිබුණි.

(ඔ) කොම්පෝස්ට් ගොඩනැගිල්ල ඉදිකිරීමේ වටිනාකම රු.1.093,472 ක් වුවද ගිවිසුම්ගත වටිනාකම වූ රු.1,175,497 ක මුදල ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව රු.82,025 ක මුදලක් වැඩිපුර ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඕ) 2014 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ බිල්පත් අනුව විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස රු.1,527,569 ක මුදලක් ගෙවිය යුතුව තිබුණද එකී මුදල ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 07 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.5,082,923 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.3,848,324 ක් වූයෙන් රු.1,234,599 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු.2,382,841 ක බැර ශේෂය මෙම වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.65,860,726 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.994,278 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.20,656,481 ක් වටිනා ගොඩනැගිලි වලට අදාල සමීක්ෂණ වාර්තා, රු.102,562,514 ක් වටිනා ණයගැතියන්ට අදාල උපලේඛන, රු.2,053,830 ක් වටිනා ණයහිමියන්ට අදාල උපලේඛන හා රු.75,668 ක් වටිනා අත්තිකාරම් වලට අදාල ලේඛන විගණනයට ඉදිරිපත් නොවූ අතර ජර්නල් සටහන් 11 හා 62 අදාලව සමුච්චිත අරමුදලට හර හා බැර කරන ලද සටහන් වලට අදාල සාක්ෂිද ඉදිරිපත් නොවීය.

1.3.6 නීති, රීති, හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ.) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 218 | සභාව ප්‍රයෝජනයට ගනු ලබන හා පදිංචියට ගනු ලබන සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,948,304 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,548,957 ක් විය.

සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල ව්‍යාපාරික හා ස්වයං උත්පාදන ආදායම රු.16,412,884 ක් වූ අතර, එකී ආදායමින් වර්ෂය තුල කාර්ය මණ්ඩල වැටුප් දීමනා හා වෙනත් දීමනා ගෙවීම සඳහා රු.14,263,455 ක මුදලක් වැය කර තිබුණි. ඒ අනුව එකී ආදායමින් වැටුප් හා දීමනා වියදම සියයට 86 ක් පමණ විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා අක්කර බදු | 281 | 2 | 18 |
| කුලී මුදල් | 1,435 | 1,340 | 209 |
| බලපත්‍ර ගාස්තු | 1,025 | 3,936 | 43 |
| වෙනත් ආදායම් | 29,680 | 49,542 | 277 |

2.2.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.21,364 ක් හිඟ ශේෂයක් තිබුණ අතර වර්ෂය සඳහා ගාස්තු හා දඩ බිල් කිරීම් රු.2,564 ක් විය. වර්ෂය තුල ඉකුත් වර්ෂය සඳහා රු.4,081 ක මුදලක්ද මෙම වර්ෂයට අදාලව රු.1,497 ක මුදලක්ද අයවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.18,350 ක් විය.

2.2.3 බදු කුලී
---------
සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.326,155 ක හිඟ ශේෂයක් තිබුණ අතර වර්ෂය සඳහා දඩ සමඟ බිල් කිරීම් වල වටිනාකම රු.1,007,632 ක් විය. වර්ෂය තුලදී ඉකුත් වර්ෂය වෙනුවෙන් රු.54,414 ක් හා වර්ෂය වෙනුවෙන් රු.1,006,949 ක මුදලක් වශයෙන් රු.1,061,363 ක මුදලක් ලැබී තිබූ බැවින් 2014 දෙසැම්බර් 31දිනට තවදුරටත් රු.272,424,හිඟව පැවතුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ ශේෂය රු.209,425 ක් වූයෙන් රු.62,999 ක වෙනසක් දෘෂ්‍යමාන විය.

2.2.4 ජල බදු
--------
සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ ශේෂය රු.252,973 ක් වූ අතර වර්ෂය සඳහා දඩ සමඟ බිල් කිරීම් රු.350,816 ක් විය. වර්ෂය තුල අයවීම් රු.364,603 කි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.239,186 ක් විය.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 174,473 |
| මුද්දර ගාස්තු | 62,424,654 |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | | |
| තෘතියික | 01 | 02 | - | 01 |
| ද්විතියික | 16 | 19 | - | 03 |
| ප්‍රාථමික | 26 | 21 | 05 | - |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | 02 | 07 | | 05 |
| | 46 | 50 | 05 | 09 |

2002 ජනවාරි 03 දිනැති අංක 14 දරන භාණ්ඩාගාර ලේකම්ගේ කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි සහ 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක , කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටුවිය යුතු බව දක්වා තිබුණද ප්‍රාදේශීය සභාව 2014 වර්ෂයේදී අනුමැතියකින් තොරව බඳවා ගන්නා ලද සේවකයින් 05 දෙනෙකු සඳහා සභා අරමුදලින් වැටුප් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
-----------------------

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධයෙන් සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය